# නර්තනය - 8 ශ්‍රේණිය

## (පළමු වාරය )



The National e-learning Portal for the General Education

8 ශ්‍රේණිය නර්තනය

නිපුණතා මට්ටම - .1.1 ස්වභාවික පරිසරයෙන් හඳුනා ගත් සත්ත්ව චර්යා ඇසුරෙන් නර්තන නිර්මාණය කරමු.

ක්‍රියාකාරකම - නර්තන මාධ්‍යයෙන් විවිධ සත්ත්ව චරිත නිරූපණය කරමු.

ඔබ මෙම සත්ත්ව චරිත හඳුනා ගැනීමට උත්සාහ කරන්න.













පහත සඳහන් අදහස් සමඟ ඔබගේ එකඟතාවය විමසා බලන්න.

1. සිවුපා සතුන් හඳුනා ගැනීම.
2. දෙපා සතුන් හඳුනා ගැනීම.
3. දෙපා සහිත සතුන්ගේ හැසිරීම් රටා විවිධ බව
4. එක් එක් සත්ත්වයින්ගේ ශරීර අංග පිහිටා ඇති ආකාරය
5. විවිධ අවස්ථාවන්වල ඔවුන්ගේ හැසිරීම් රටාවල විවිධත්වය
6. පොළව මත, පොළොව හා ඉහළ තලයේ , මෙන් ම ඉහළ තලයේ ද හැසිරෙන් ආකාර අනුව සතුන්ගේ චලනවල විවිධත්වයක් දක්නට ලැබීම.

රූප සටහනින් රූප සටහනට විමසිලිමත්ව බැලීමේ දී ඉහත සඳහන් කරුණු කාරණා ඔබට සත්ත්ව චරිත හඳුනා ගැනීමට මහත් පිටුවහලක් වනු ඇත.

- සතුන්ගේ විවිධත්වය නිරීක්ෂණය කර හඳුනා ගැනීමෙන් පසු පහත සඳහන් ආකාරයට තොරතුරු සටහන් කරන්න.

  උදා - උකුස්සා

- ❖ තියුණු ඇස් සහ පියාසර කිරීමේ දී අත්තටු චලනය සුවිශේෂී වේ.ගොදුරු දැකීම ඒ කෙරෙහි යොමු වීම'ගොදුර ඩැහැ ගැනීම ආදී සියලු චලන සඳහා අංග , ප්‍රත්‍යංග , උපාංග සියල්ල භාවිත වන අවස්ථා දක්නට ඇත.




ඔබ සතුන්ගේ චලන නිර්මාණය කිරීමට යොමු වීමට ප්‍රථම එම චරිතවල අංග , ප්‍රත්‍යංග , උපාංග භාවිත කිරීම තුළින් නර්තනය මාධ්‍ය කරගෙන ඔබ එම චරිතයට ජීවයක් ලබා දෙන්නේ කෙසේ දැයි සිතන්න.දක්වා ඇති උදාහරණ සැලකිල්ලට ගනිමින් පහත සඳහන් සතුන් පිළිබඳවත් වෙන වෙනම තොරතුරු දක්වන්න.

1. අලියා
2. සිංහයා
3. අශ්වයා
4. මොණරා
5. කුකුළා

ඔබ විස්තරාත්මකව දක්වන ලද ඉහත සඳහන් චරිතවල ශරීරයෙහි අංග , ප්‍රත්‍යංග , උපාංග හැසිරවීම තාලානුකූල , රිද්මයානුකූල හා ප්‍රකාශනාත්මක චලන විවිධ තල හා දිසා වලට ගමන් කරමින් රංග රටා මැවෙන සේ චරිත නිරූපණය කිරීමට උත්සාහ ගන්න.මෙහි දී චරිතවල අනන්‍යතා ලක්ෂණ හොඳින් අධ්‍යනය කර ගුරුවරයාගේ මඟ පෙන්වීම සමඟ නර්තන මාධ්‍යයෙන් චරිතයන් නිරූපණයට උත්සාහ කරන්න.

නර්තන මාධ්‍යයෙන් - මෙහි දී බෙර පදයෙන් හා තාලම්පටින් ලබා දෙන තාලය ඒ අනුව රිද්මය හා ප්‍රකාශනය ද ඉතා වැදගත් වේ.

උදා - අශ්වයාගේ ගමන නිරූපණය කිරීමට දොං ජිංත ගත දොංත යන බෙරපද තාලය යොදා ගත හැකිය.

එය වඩාත් පැහැදිලි වන සේ පහත සඳහන් අවස්ථාවක් අවධානයට යොමු කළ හැක.

1. හිරු පායා එන උදෑසනක වන සිරි නරඹමින් තටු විහිදා නටන මොණරෙකි.නොහිතූ ආකාරයට හදිසියේ ම දඩයම් කරුවෙකුගේ උගුලකට තම පාදය හසු විය.ගැලවී යාමට උත්සාහ කළ ද එය එය අසාර්ථක වී පාදය ද තුවාල විය.එතැනට පැමිණි තාපසයා මොණරා උගුලෙන් බේරා ගැනීමට උත්සාහ කළ ද උගුලෙන් නිදහස් වූ මොණරාට ගමන් කිරීමට තරම් දෙපා ශක්තිමත් නොවී අසරණ විය.එම සිදුවීම් අවස්ථාව නර්තන නිර්මාණයෙන් ඉදිරිපත් කිරීමේ දී පහත සඳහන් අවස්ථා නිර්මාණාත්මකව යොදා ගත හැක.

1. මධ්‍ය ලයට ගැළපෙන තාල ලක්ෂණ අනුව ගමන් කිරීම.
2. ගමන් කිරීමේ දී බෙල්ල , දෙඅත් , දෙපා යොදා ගනිමින් චලන නිර්මාණය
3. මොණරා පිල් විදහා නැටීමේ දී කැරකීම් , පැනීම් ආදී ලෙස සතුටින් නිරූපණය කරන චලනයන් යොදා ගැනීම.
4. පාදයක් උගුලට හසු වන අවස්ථාව නිරූපණය කිරීමේ දී වේදනාව, ආයාසය, උත්සාහය යන භාවයන් නිරූපණය වන ලෙස ද චලනයන් නිර්මාණය කර ගැනීම.
5. උගුලෙන් නිදහස් වන අවස්ථාවේ දී දැනෙන සතුට සමඟම පාදය තුවාල වීමෙන් දැනෙන වේදනාව හා අසරණකම මෙන් ම සිදු වීමෙන් බියට පත් වන ආකාරය නිරූපණය වන ලෙස චලන නිර්මාණය කිරීම.
6. පාදයක් බිම දිගේ අදිමින් කැලය තුළට වේදනාවෙන් ගමන් කරන ආකාරය චලන තුලින් නිරූපණය කිරීම.

<u>කාර්‍ය පත්‍රිකාව</u>

1) නර්තන මාධ්‍යයෙන් නිරූපණය කළ හැකි සත්ත්ව චරිත 4 ක් නම් කරන්න.
2) නර්තන මාධ්‍යයෙන් නිරූපණය කළ හැකි චරිතයකට අදාළ සිද්ධියක් ලියා දක්වන්න.
3) සිද්ධියක් නිරූපණයේ දී ඒ තුළ අන්තර්ගත වන චලන වර්ග නම් කර දක්වන්න.
4) නිවැරදි පිළිතුර යා කරන්න.

| | |
|---|---|
| a. අංග | නළල , ක්ම්මුල , ඇස , නාසය , ඇහිබැම හා නිකට |
| b. ප්‍රත්‍යංග | හිස , අත් , පා , කඳ |
| c. උපාංග | බෙල්ල , උරහිස , වැළමිට , දණහිස |